**බණ්ඩාරවෙල මහා නගර සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**
---------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**
----------------

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
---------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 අප්‍රේල් 02 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර,එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 සැප්තැම්බර් 26 වන දින නගරාධිපතිවරයා වෙත යවා ඇත.

**1.2 අහිතකර මතය**
-----------------

මෙම වාර්තාවේ 1.3, 3.4(ඉ), 3.6 ඡේදයේ දක්වා ඇති කරුණු වල වැදගත් බව හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට බණ්ඩාරවෙල මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
----------------------------------------

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
-----------------------

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ගිණුමේ ශේෂය රු. 241,540 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා මුද්දර ගාස්තු ආදායම රු.3,600,000 ක් වුවත්, එය රු.17,480,695ක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් ආදායම් රු.13,880,695 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා උසාවි දඩ ආදායම රු.300,000 ක් වුවත්, එය රු.116,772 ක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් උසාවි දඩ ආදායම් රු.183,228 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී මිළදී ගෙන තිබුණු පුස්තකාල පොත් වල වටිනාකම රු.307,253 ක් වුවත්,එය රු.247,506 ක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් පුස්තකාල පොත් ශේෂය රු.59,747 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දි ඉඩම් හා ගොඩනැඟිලි රු.804,564 ක් ගිණුම් ගත කර නොතිබුණි.

(ඊ) විවිධ තැන්පත් ගිණුමේ ආරම්භක ශේෂය රු.8,478,100 ක් වුවත්, එය රු.8,118,138 ක් ලෙස ඉදිරියට ගෙනඒම හේතුවෙන් විවිධ තැන්පත් රු.359,962 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි ජල ගාස්තුව රු.5,659,295 ක් වුවද, එය රු.56,592,995 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් ජංගම වත්කම් රු.50,933,700 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඍ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොලිය රු.1,062,500 ක් ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් ජංගම වත්කම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(එ) සමුච්චිත අරමුදල් ගිණුමේ ආරම්භක ශේෂය රු.87,735,869 ක් වුවත්, එය රු.117,299,233 ක් ලෙස ඉදිරියට ගෙනඒම හේතුවෙන් සමුච්චිත අරමුදල් ගිණුම රු.29,563,364 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඒ) සමුච්චිත අරමුදල් ගිණුමේ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.192,764,865 ක් වුවත්, එය රු.124,045,688 ක් ලෙස දැක්වීමෙන් සමුච්චිත අරමුදල් ගිණුම රු.68,719,177 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඔ) විශාඛා මාවත තොග එළවළු මධ්‍යස්ථානයේ වර්ෂය අවසානයේ හිඟ බදු කුලී ආදායම රු.2,794,798 ක් වුවත්, එය රු.750,042 ක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් ජංගම වත්කම් රු.2,044,756 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඕ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගව මස් කඩ කුලී හිඟ ආදායම රු.3,517,933 ක් වුවද, එය රු.612,443 ක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් වර්ෂයේ ආදායම රු.2,905,490 කින් හා ජංගම වත්කම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ක) 2015 මැයි 11 දින සීවලී පාර සාප්පු සංකීර්ණය ඉදිකිරීමේ කර්මාන්තය සඳහා අත්තිකාරම් ලෙස ගෙවා තිබූ රු.6,163,460 ක් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබීම හේතුවෙන් ජංගම වත්කම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ග) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තොග ලේඛන අනුව පොදු ගබඩා තොගය රු.3,288,701 ක් වුවත්, එය රු.2,231,096 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් අතිරික්තය රු.1,057,605 කින් අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 **නොසැසඳුණු ගිණුම්**

-----------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු. 92,939,738ක් වූ ගිණුම් විෂයයන් 05කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා වාර්තාවල දැක්වෙන ශේෂයන් අතර වෙනස්කම්වල එකතුව රු.12,348,711 ක් විය.

1.3.3 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-------------------------------------

(අ) **ලැබිය යුතු ගිණුම්**

---------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයකර ගතයුතු රු.149,273,620 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂය තුළ වර්ෂ 05 ක් වූ හිඟහිටි වෙනත් ආදායම් රු.131,578,046 ක් , වර්ෂ 03 ක් වූ හිඟහිටි වරිපනම් රු.8,993,104 ක් වර්ෂ 03 ක් වූ කර්මාන්ත සඳහා ලැබිය යුතු රු.8,702,470 ක් ඇතුලත් වී තිබුණි.

(ආ) **ගෙවිය යුතු ගිණුම්**

----------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.17,724,295 ක් වූ ගෙවිය යුතු ශේෂය තුළ වර්ෂ 03 ක් වූ ණයහිමියෝ රු.8,094,615 කින් හා කර්මාන්ත ණයහිමියෝ රු.9,629,680 කින් සමන්විත විය.

1.3.4 **විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම.**

----------------------------------------------------------

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.6,494,862 ක් වූ ගිණුම් විෂයයන් 02 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.5 **අනුකූල නොවීම්**

-------------------

1.3.5.1 **නීති, රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

-----------------------------------------------------------------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | | **නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම** |
|---|---|---|---|---|
| | | | රු. | |
| (අ) | | මහා නගර සභා ආඥාපනත | | |
| | (i) | 42 වගන්තිය | | අනවසර ඉදිකිරීම් 54 ක් සම්බන්ධයෙන් නීත්‍යානුකූලව කටයුතු කර නොතිබුණි. |
| | (ii) | 218 වගන්තිය | | 2014, 2015 වර්ෂ සඳහා පරිපාලනය පිළිබඳ සවිස්තර වාර්තාවක් සභාව වෙත ඉදිරිපත් කර සති 06 ක් තුළ අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| | (iii) | 254 වගන්තිය | 36,360,603 | යම් වරිපනම් බද්දක්, බද්දක්, කුලියක්, ගාස්තුවක්, අයබද්දක්, දඩ මුදලක් හෝ වෙනයම් ගෙවීමක් මහා නගර සභාවට අයවිය යුතු විට ඒවා අයකරගෙන නගරසභා අරමුදලට බැරකළයුතු වුවත්, එසේ කර නොතිබුණි. |
| (ආ) | | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය XIX වැනි පරිච්ඡේදයේ 4.1 වගන්තිය | | සේවා ස්ථානයේ සිට යම් කිසි දුර ප්‍රමාණයක පදිංචි ස්ථිර නිවසක් හිමි හා අවුරුදු 5කට වඩා රජයේ නිලනිවාස භාවිතා කරන ලද නිලනිවාස හිමිකමක් නොමැති නිලධාරින් 3 දෙනෙකු වෙනුවෙන් නිවාස ලබා දී තිබුණි. |
| (ඇ) | | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | |

| | | | |
|---|---|---|---|
| (i) | මු.රෙ 571 | 344,837 | කල්ඉකුත් වු තැන්පතු 19 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ii) | මු.රෙ 751 | 47,480 | ගබඩා ද්‍රව්‍ය ලැබීම් හා නිකුත් කිරීම් වල විස්තර ඇතුලත් කර තොග පොත් නඩත්තු කර පවත්වාගෙන යා යුතු වුවත්, සියලුම ගබඩා ද්‍රව්‍ය ලැබීම් හා නිකුත් කිරීම් නිසි පරිදි ගණනය කර තොග ලෙජර්, ගබඩා ලෙජරය නිතිපතා යාවත්කාලීන කර නොතිබුණි. |
| (ඈ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය | | සභාව සතු වාහන 29 ක ඉන්ධන දහන පරීක්ෂාවන් සිදුකර නොතිබුණි. |
| (ඉ) | 2015 ජූලි 10 දිනැති අංක PFD/ASD /02/ Veh –circular – 2015 දරන මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය | | සභාව සතු අබලන් වූ හා භාවිතා කිරීමට නොහැකි වාහන 05 ක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඊ) | 2009 සැප්තැම්බර් 18 දිනැති අංක PF/437 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | 33,960 | සභාව සතු වාහන 03 ක් සඳහා රක්ෂණ නියෝජිතයෙකු මාර්ගයෙන් රක්ෂණාවරණය ලබාගෙන තිබුණි. |
| (උ) | 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය | | මහා නගර සභා වරිපනම් සීමාවේ වරිපනම් 1 සිට 9 දක්වා වූ කොට්ඨාශ සඳහා නව තක්සේරුවක් වර්ෂ පහකට වරක් සිදුකර නොතිබුණු අතර 2007 වර්ෂයේ තක්සේරුව පදනම් කරගෙන සමාලෝචිත වර්ෂය සඳහා ද වරිපනම් බදු අයකර තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.93,183,576 ක්වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 39,383,629 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම් ,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් .31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් .31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 26,405,000 | 26,405,000 | 21,163,827 | 12,561,003 | 25,605,986 | 25,605,986 | 19,459,086 | 11,877,312 |
| (ii) | කුලී | 33,032,000 | 33,032,000 | 22,965,516 | 28,147,202 | 29,821,000 | 29,821,000 | 23,355,791 | 16,579,366 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 7,810,000 | 7,810,000 | 7,957,957 | (147,957) | 8,700,000 | 8,700,000 | 8,577,852 | 122,148 |
| (iv) | වෙනත් ආදායම | 19,019,000 | 19,019,000 | 25,551,453 | (4,199,645) | 153,774,000 | 153,774,000 | 127,634,693 | 39,039,191 |
| | එකතුව | 86,266,000 | 86,266,000 | 77,638,753 | 36,360,603 | 217,900,986 | 217,900,986 | 179,027,422 | 67,618,017 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

2017 දෙසැම්බර් 31 දිනට මුළු බිල්කල ආදායම රුපියල් මිලියන 86.2 ක් වූ අතර, වර්ෂය තුල රැස්කල ආදායම රුපියල් මිලියන 77.6 ක් විය. කෙසේ වුවත් වර්ෂය අවසන් වන විට රුපියල් මිලියන 36.3 ක ආදායමක් අයකර ගැනීමට තිබුණු අතර, පෙර වර්ෂය සමඟ සැසඳීමේදී හිඟ ආදායම සියයට 46 කින් අඩුවී තිබුණි.

### 2.2.3 වරිපනම් හා බදු

**හිඟ ජල බිල් ආදායම්**

තන්තිරිය පතන ජල යෝජනා ක්‍රමය යටතේ බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව විසින් 2013 වර්ෂයේ ඔක්තෝබර් සභාව වෙත පවරා දී තිබුණු ජල සැපයුම් 10 කට අදාලව අයවිය යුතු හිඟ මුදල් රු.163,042 ක් හා ජල පරිභෝජන ගාස්තු රු.565,929 ක් 2017 දෙසැම්බර් 31 දිනය වන විටත් අයකර ගෙන නොතිබුණි.

### 2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.65,000 ක් හා මුද්දර ගාස්තු රු.6,820,000 ක් විය.

3. **මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

3.1 **කාර්ය සාධනය**

-----------------

මහා නගර සභා ආඥාපනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය,පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳව කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම,ජනතාවගේ සුබවිහරණය,පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) **ක්‍රියාකාරී සැලැස්ම**

----------------------

සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්මක් සකස් කර නොතිබුණි.

(ආ) **කර්තව්‍යාන් ඉටු කිරීමේ ප්‍රමාදය**

----------------------------------

පහත සඳහන් කර්තව්‍යාන් ඉටු කිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

| | කර්තව්‍ය | ඇස්තමේන්තුගත පිරිවැය | ගිවිසුම්ගත දිනය | ගෙවා ඇති අත්තිකාරම් | 2017.12.31 දිනට ප්‍රමාදවූ කාලසීමාව |
|---|---|---|---|---|---|
| | | රු. | | රු. | |
| (i) | තොගපොල BLOCK-01 | 128,309,769 | 2014.09.09 | 22,179,396 (අත්තිකාරම් හා කොටස් ගෙවීම) | මාස 38 |
| (ii) | Others work -03 (කාණු පද්ධතිය) | 33,456,186 | 2014.08.26 | 3,929,215 | මාස 18 |
| (iii) | වැව ඉදිකිරීම(Reservoir) | 10,033,680 | 2014.08.27 | 4,108,704(i,ii කොටස් ගෙවීම) | මාස 22 |
| (iv) | සීවලී පාර වෙළඳ සංකීර්ණය ඉදිකිරිම | 42,823,373 | 2015.04.09 | 6,163,160 | මාස 08 |

(ඇ) **තිරසර සංවර්ධන ඉලක්ක**

-----------------------------

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගු කාලීන සැලසුම් 2018 ජූලි 31 දින තෙක් සකස් කර නොතිබුණි.

3.2 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) වාහන 08 ක මයිලෝ මීටර ක්‍රියාත්මක තත්වයේ නොපැවතුනි.

(ආ) 2017 වර්ෂය තුළ සභාවේ මහජන සෞඛ්‍ය පරික්ෂක විසින් ඉටු කළ රාජකාරි සදහන් නොකර තිබියදී ප්‍රවාහන දීමනා,අතිකාල හා නිවාඩු දින වැටුප් ලෙස සමාලෝචිත වර්ෂයේදී රු.381,902 ක් ගෙවා තිබුණි.

3.3 **මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

(අ) **සේවක පුරප්පාඩු හා අතිරික්ත**

----------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 48 ක් හා අතිරික්ත සේවකයින් 07 දෙනෙකු විය.

(ආ) **සේවක ණය**

---------------

දැනට සේවයේ නොමැති සේවකයින් 04 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 43,215 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.4 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

------------------------------

(අ) 2007 වර්ෂයෙන් පසුව සභාවේ වරිපනම් තක්සේරුවක් කර නොතිබූ අතර, 2017 වර්ෂයේ කඩකුලී වලින් කොටසක් පමණක් තක්සේරු කර තිබුණි.

(ආ) භාණ්ඩ වර්ග 02 ට අදාළව ලෙජරය අනුව හා භෞතික සත්‍යාපන ශේෂය අතර වූ රු.40,880 ක ඌනතාවයක් ද, භාණ්ඩ වර්ග 02 කට අදාළව ලෙජරය අනුව හා භෞතික ශේෂය අතර රු.6,600 ක අතිරික්තයක් විය.

(ඇ) අගරු චෙක්පත් සටහන් කිරීම සඳහා සභාව අගරු චෙක්පත් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි.

(ඈ) සභාවට එරෙහිව බාහිර පාර්ශවයන් විසින් පවරා තිබූ විවිධ නඩු 08 ක් 2017 දෙසැම්බර් 31 දින වනවිටත් අවසන්වී නොතිබුණි.

(ඉ) සභාව විසින් 2014 හා 2015 වර්ෂවල ක්‍රියාත්මක කළ කර්මාන්ත 04 ක් සඳහා අත්තිකාරම් මුදල් රු.36,380,475 ක් කොන්ත්‍රාත්කරුවන්ට ලබාදී තිබූ නමුත්,අදාළ කොන්ත්‍රාත්කරුවන් කොන්ත්‍රාත් අතහැරීම නිසා අත්තිකාරම් අයකරගත නොහැකිවී තිබුණි. තවද එකී කොන්ත්‍රාත්කරුවන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීමටද සභාව අපොහොසත් වී තිබුණි.

3.5 **වත්කම් කළමනාකරණය**

---------------------------

**තොග පාලනය**

----------------

(අ) 2017 දෙසැම්බර් 31 දිනට ගබඩා ලෙජරය හා භෞතික තොග නියැදි පරීක්ෂාවේදී භාණ්ඩ වර්ග 04 ක රු. 47,480 ක වෙනසක් නිරූපණය විය.

(ආ) මුදල් රෙගුලාසි 752 ප්‍රකාරව භාණ්ඩ මිලදී ගැනීම් පිළිබඳ සෑම සටහනක්ම බඩු ලේඛන වවුචරයකින් තහවුරු විය යුතු අතර, ලැබීම් හා නිකුත් කිරීම් යන දෙවර්ගයේම ගනුදෙනු අනුපිළිවලින් අංක යොදා ගබඩා ලේඛන වල ඇතුලත් කලයුතු වුවත්, ගබඩා ලේඛනවල ඇතුලත් නොවූ භාණ්ඩ වර්ග 14 වූ අතර, එහි වටිනාකම රු. 188,737 ක් විය.

3.5.1 **පවරා නොගත් වත්කම්**

--------------------------

2015 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය අනුව බාහිර පාර්ශවයකට නිකුත් කර තිබූ සභාවට අයත් ලැප්ටොප් පරිගණකයක් නැවත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.5.2 **නිෂ්ක්‍රිය වත්කම්**

--------------------

ධාවනයෙන් ඉවත්කර තිබූ වාහන 06 ක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

3.5.3 **පුස්තකාල කියවීම් පොත් ඌනතාවය**

---------------------------------------

පුස්තකාලය විසින් නිකුත් කර නැවත භාරදීමේ කාලය ඉක්මවා තිබුණු මුළු පොත් සංඛ්‍යාව 150 ක් වූ අතර, ඒවායේ වටිනාකම රු.37,793 ක් විය.

3.5.4 **වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ ක්‍රියාත්මක නොකිරිම**

------------------------------------------------------------------

2016 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල නිර්දේශ අනුව පෙන්වා දී තිබුණු 2012, 2013, 2014 හා 2015 වර්ෂවල සිට පැවත එන භාණ්ඩ හා උපකරණ ඌණතාවය සම්බන්ධයෙන් සභාව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

3.5.5 **වාහන උපයෝජනය**

----------------------

පළාත් පාලන ආයතන වල ප්‍රවාහන පහසුකම් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ 2015 පෙබරවාරි 19 දින සභාවට ලැබී තිබුණු කැබ් රථයේ වටිනාකම රු.6,390,000 ක් වූ අතර, කි.මී 9,311 ක් ධාවනය කිරීමෙන් පසු 2015 අප්‍රේල් 09 දින අනතුරකට ලක්වී තිබුණි.පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) අනතුර සම්බන්ධයෙන් මු.රෙ 104 (2), 104 (3), 104 (4) හා 105 (2) අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) අනතුර සිදුවී සමාලෝචිත වර්ෂයේ අවසානයට වර්ෂ දෙකක් ගතවී තිබුණද ඊට අදාළ හානිය රක්ෂණයෙන් ප්‍රතිපූර්ණය කරගෙන නොතිබූ අතර,වාහනය අලුත්වැඩියා කර නොතිබුණි.

(ඇ) වාහනය අලුත්වැඩියා කිරීම සඳහා රු.4,184,490 ක් වැය කිරීමට සිදුවී තිබුණද,එම මුදල් වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඈ) 2015 මාර්තු මස සිට මේ දක්වා වාහනය කොළඹ පෞද්ගලික ගරාජයක ගාල්කර තිබුණි.

(ඉ) අනතුරට වගකිවයුතු අය හඳුනාගෙන නොතිබුණි.

3.6 **දූෂ්‍ය අක්‍රමිකතා**

-------------------

(අ) සභාවේ මාර්ගයකට සිදුකර තිබුණු පාඩුව වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවකුගෙන් වන්දි වශයෙන් ලැබී තිබුණු රු.මිලියන 4 ක චෙක්පතක් ගිණුම්ගත නොකිරීම හා වලංගු කාලය තුළ බැංකුගත නොකර ළඟ තබාගැනීම නිසා චෙක්පත අගරුවී තිබුණු අතර,චෙක්පතට අදාළ රුපියල් මිලියන 04 ක මුදල කොන්ත්‍රාත්කරුගෙන් අයකරගත නොහැකි වී තිබුණි.

(ආ) මාර්ගයක් ඉදිකිරීමට අදාළ රු.4,492,086 ක් වූ පළමු ගෙවීම් බිල්පත අස්ථානගත කිරීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් පවත්වා නොතිබුණි.

3.7. **ප්‍රසම්පාදනය**

--------------

3.7.1 **ප්‍රසම්පාදන සැලැස්ම**

-----------------------

සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

3.7.2 **කොම්පැක්ටර් රථයක් මිලදී ගැනීම.**

--------------------------------------

සභාව සඳහා රු. මිලියන 9.5 ක් වැය කර කොම්පැක්ටර් රථයක් මිළදීගෙන තිබු අතර, ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) වාහනය මිළදී ගැනීමට පෙර සභාවේ වාර්ෂික අයවැය ලේඛනය මඟින් ප්‍රතිපාදන වෙන් කරගෙන නොතිබුණි.

(ආ) තාක්ෂණික ඇගයීම් කමිටුවේ අනුමත පිරිවිතරයන්ට පටහැනිව මෙම රථයමිළදී ගෙන තිබුණි.

(ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.3 මාර්ගෝපදේශය අනුව ලබාගෙන තිබුණු ලංසු සුරක්ෂණය ,ප්‍රසම්පාදන කමිටු වාර්තා, ප්‍රසම්පාදන දැන්වීම් හා සත්‍ය ලංසු ලේඛන සමඟ සැසඳීමේදී එකිනෙකට වෙනස් වටිනාකම් පෙන්නුම් කෙරුණි.

3.7.3 **කොන්ත්‍රාත් පරිපාලනය**

---------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවේ නගරාධිපති විසින් ප්‍රසම්පාදන කමිටුවක් හා තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කරන ලෙස පළාත් අමාත්‍ය මණ්ඩලයෙන් ඉල්ලීම් කර තිබුණද, එසේ නොවීම හේතුවෙන් 2014 සැප්තැම්බර් 10 දින රු.434,469,751 ක් වටිනා ඉදිකිරීම් කොන්ත්‍රාත් සභාවේ ප්‍රසම්පාදන කමිටුව විසින් කොන්ත්‍රාත්කරුවන්ට ප්‍රදානය කර තිබුණි.

(ආ)(i) මහා නගර සභා ආඥාපනතේ 228 හා 229 වගන්ති ප්‍රකාරව හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2:14:1 ඡේදය ප්‍රකාරව රුපියල් මිලියන 200 ඉක්මවන කොන්ත්‍රාත් අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුව යටතේ ක්‍රියාත්මක විය යුතු වුවත්, තොග පොල ඉදිකිරීම කොන්ත්‍රාත්තුව කොටස් කර සභාව විසින් ටෙන්ඩර් කර තිබුණි.

(ii) මෙම ඉදිකිරිම් කොන්ත්‍රාත්තුව යටතේ block 01 ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තුගත මුදල රු.128,309,770 ක් වුවත්, රු.88,634,140 කට පෞද්ගලික කොන්ත්‍රාත් පාර්ශවයක් සමඟ 2014 සැප්තැම්බර් 10 දින ගිවිසුම් වලට එළඹ, රු.22,179,397 ක අත්තිකාරම් ලබාදී තිබුණද, 2018 අගෝස්තු වනවිටත් ගොඩනැඟිල්ලේ අත්තිවාරම් කැපීම පමණක් සිදුකර තිබුණි.

(iii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7:9:2 ප්‍රකාරව වැඩ කොන්ත්‍රාත් සම්බන්ධයෙන් ඉංජිනේරු ඇස්තමේන්තුව සමඟ ටෙන්ඩර් (Bid) සැසඳීමේදි ඇස්තමේන්තුවට වඩා සරානුකූලව අඩුවන අවස්ථා වලදී ලංසු මිළගණන් වලට සාධාරණව ඇගයීම් සිදුකළ යුතු වුවත්, Block 01 ව්‍යාපෘතිය සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.

(iv) Block 01 හි ව්‍යාපෘති ගිවිසුම අනුව 2015 සැප්තැම්බර් 09 දිනට වැඩ අවසන් කළයුතු වුවද 2018 අගෝස්තු වනවිට වර්ෂ 3 කට වැඩි කාලයක් ප්‍රමාද වී තිබුණු අතර,ව්‍යාපෘතිය අතහැර දමා තිබුණි.

(ඇ) **කාණු පද්ධතිය සකස් කිරීම Block 3**

---------------------------------------

සභාව විසින් ඇස්තමේන්තුගත හා ගිවිසුම් ගත මුදල රු.33,456,186 ක් වන තොගපොල (Block 04,06,07 ඇතුළුව) කාණු පද්ධතිය ඉදිකිරීම පෞද්ගලික සමාගමක් සමඟ රු.80,507,769 ක මුදලකට 2014 අගෝස්තු 26 දින ගිවිසුම්ගතවී 2015 සැප්තැම්බර් 19 වන දින වැඩ අවසන් කළයුතු වුවත්, මේ දක්වා එම ඉදිකිරීම් ආරම්භ කර නොතිබුණු අතර, ඒ සඳහා රු.3,929,215 ක අත්තිකාරමක්ද ගෙවා තිබුණි.

(ඈ) **වැව ඉදිකිරීම**

---------------

බණ්ඩාරවෙල තොග පොල අසළ වැව ඉදිකිරීම සඳහා පෞද්ගලික සමාගමක් සමඟ ඉංජිනේරු ඇස්තමේන්තුව හා ගිවිසුම් මුදල රු.10,033,680 ක් සඳහා 2014 අගෝස්තු 27 දින ගිවිසුම්ගතවී 2015 අගෝස්තු 26 වන දින අවසන් කළයුතු වුවත්, මේ දක්වා එම වැඩ කොටස ඉටු කර නොතිබුණු අතර,සමාගමට අත්තිකාරම් ලෙස රු.4,108,704 ක් ගෙවා තිබුණි.

(ඉ) තොග පොල 3,4,6 හා 7 ව්‍යාපෘති 2018 අගෝස්තු වනවිටත් වැඩ ආරම්භ කර නොතිබුණි.

(ඊ) **සීවලී පාර සාප්පු සංකීරණය ඉදිකිරීම**

-------------------------------------------

සභාව විසින් 2015 අප්‍රේල් 09 දින කොන්ත්‍රාත්කරුවකු සමඟ සීවලී පාර සාප්පු සංකීර්ණය ඉදිකිරීම සඳහා රු.30,815,863 ක වටිනාකමකට ගිවිසුම්ගත වී තිබුණු අතර,ඒ පිළිබඳ විගණනයේදී පහත කරුණු අනාවරණය වී තිබුණි.

i. ඉදිකිරීම සඳහා සියයට 20 ක අත්තිකාරම් ලෙස 2015 මැයි 08 දින රු.6,163,172 ක් ගෙවා තිබුණි.

ii. ගිවිසුම් ප්‍රකාරව 2015 දෙසැම්බර් 31 දින වැඩ අවසන් කළයුතු වුවත්, මේ දක්වා අදාළ ඉදිකිරීම ඉටු කර නොතිබුණි.

iii. කාර්යසාධන ඇපකරය මඟින් අත්තිකාරම් මුදල පියවා ගැනීමට කටයුතු කර කොන්ත්‍රාත්තුව අවසන් කිරීමට කටයුතු කර නොතිබුණි.

iv. සීවලී පාර ඉදිකිරිම සඳහා වේල්ල කැපීම හේතුවෙන් සභාවේ නිල නිවාසයට සම්පූර්ණයෙන්ම අලාභහානි සිදුවී තිබූ අතර, ඒ සඳහා අලාභය තක්සේරු කර අයකර ගෙන නොතිබුණි.

4. **ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

---------------------------------------

4.1 **අයවැය පාලනය**

-------------------

සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛනයෙහි අයවැයගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේ දී සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් උපයෝගී කරගෙන නොතිබුණි.

5. **පද්ධති හා පාලන**

-------------------

විගණනයේදී නිරික්ෂණය වු අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර,පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) | ආරම්භක ගිණුම් ශේෂ නොගැලපීම. |
| (ආ) | ණයගැතියෝ හා ණයහිමියෝ | (i) | ණයහිමි හා ණය ගැති ශේෂ නිරවුල් නොකිරිම. |
| | | (ii) | ණයගැති ශේෂ සනාථ කිරීම් ලබා නොගැනීම. |
| | | (iii) | හිඟ ආදායම් අයකර නොගැනීම. |
| (ඇ) | ආදායම් පාලනය | (i) | හිඟ ආදායම් අයකර ගැනීමේ ප්‍රගතිය දූර්වලවීම. |
| | | (ii) | නව තක්සේරු මත වරිපනම් අය කර ගැනීමට කටයුතු නොකිරිම. |
| (ඈ) | ස්ථාවර වත්කම් | (i) | ඉඩම් ගොඩනැඟිලි නිවැරදිව තක්සේරු නොකිරීම. |
| | | (ii) | ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන නොකිරිම. |
| (ඉ) | තොග පාලනය | (i) | තොග ලේඛන නිවැරදිව නඩත්තු නොකිරිම. |
| | | (ii) | භෞතික තොග ශේෂයන් හා තොග ලේඛන නොසැසඳීම. |
| (ඈ) | කොන්ත්‍රාත් පාලනය | (i) | ගිවිසුම්ගත කාලය තුළ කර්මාන්ත නිම කිරීමට කටයුතු කර නොතිබීම. |